# පොළොන්නරු යුගයේ සිට පෘතුගීසි අවධිය තෙක් පස්යොදුන් රට පාලකයන් පිළිබඳ විමසීමක්

**රන්දික කේ.ජී.එච්,[1] ඉෂිණි ආර්.එම්.[2]**

පස්යොදුන් රට ලෙස අද දක්වන්නේ කළු ගඟත්, බෙන්තර ගඟත් අතර මුහුදු වෙරළ සිට රට මධ්‍යයෙහි පිහිටි ප්‍රදේශයයි. සරුසාර භූමියක් හිමි පස්යොදුන් රට අනුරාධපුර පොළොන්නරු යුගවල දී දක්ඛිණ දේශයටත්, තෙවන විජයබාහු රජ සමයෙන් පසු භාවිතා වූ මායා රටටත් අයත් විය. ඒ අනුව ඔටුන්න හිමි කුමරු එනම් යුවරාජගේ පාලන ප්‍රදේශයට මෙම භූමිභාගය අයත් විය. ක්‍රමිකව ජනාවාස වූ පස්යොදුන් රට පිළිබඳව පළමුවෙන් මූලාශ්‍රයක් ලෙස චූලවංශයේ දැක්වෙන අතර ඒ "පංච යෝජනා රට්ඨාදී" ලෙසිනුත් පළමුවෙන් දක්වා ඇති සෙල්ලිපිය ලෙස ගලපාතවිහාර ශිලා ලිපියේ එන "පස්යොදුන් වග කාරිය කොටැ සිටි " ලෙසත් දැක්විය හැක. අනුරාධපුර අගභාගය හා පොළොන්නරු මුල් කාලයේ සිට පස්දුන් රට පිළිබඳ මූලාශ්‍ර තතු අපට හමුවේ. ඒ තුළින් එම කාලයේ සිට පෘතුගීසීන් කෝට්ටේ රාජධානිය පාලනය අල්ලා ගත් සමය තෙක් පස්දුන් රට පාලනය කළ පාලකයන් කවුරුන් ද යන පර්යේෂණ ගැටළුව මුල් කරගෙන පස්දුන් රට පාලනය කළ පාලකයන් පිළිබඳ විමසීමට සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර දක්වන දායකත්වය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම අරමුණයි. මේ පිළිබඳ හදාරනු වස් ගලපාත විහාරය, පවුරකන්ද විහාරය ආදී විහාර ක්ෂේත්‍ර අධ්‍යයනයත්, පස්යොදුන් රට ඉතිහාස කෘතියත්, පස්යොදුන් රට සංස්කෘතික ඉතිහාස සඟරාවත්, චූලවංශය, පූජාවලිය මෙන් ම අන්තර්ජාලය ද  උපකාරී විය. මූලාශ්‍ර තොරතුරු අනුව ගත්කල ප්‍රස්තුත ගත කාල පරාසය තුළ පස්දුන් රට ප්‍රථම පාලකයා ලෙස ලක්දිව එක්සේසත් කරන ලද මහා විජයබාහු රජුගේ සිට සීතාවක ටිකිරි බණ්ඩාර තෙක් පස්යොදුන් රට පාලකයන් පිළිබඳ තොරතුරු විවිධ මූලාශ්‍ර තුළින් අපට හෙළිවේ. ඒ අනුව මහාවිජයබාහු, මනාභරණ, කීර්ති ශ්‍රී මේඝ, පළමු පැරකුම්, තිස්සමාරනාවන්, කේශධාතුලෝක, කේශධාතු දේවරාජ, කහම්බල්කුළුමින්දල්නා, දෙවන පැරකුම්, දේවපතිරාජ, ප්‍රභූරාජ අලගක්කෝනාර, කුමාර අලකේශ්වර, හයවෙනි පරාක්‍රමබාහු, අගලවත්තේ කැකුළන්දොළ ශ්‍රී වර්ධනප්‍රතිරාජ, වීදාගම මහා මෛත්‍රී හිමි, රයිගම් බණ්ඩාර, මායාදුන්නේ, වීදිය බණ්ඩාර, පලමුවෙනි රාජසිංහ ලෙස ඔවුන් පෙලගැස්විය හැක. පොළොන්නරු යුගයේ සිට සීතාවක තෙක් රට එක්සේසත් කළ නරපතීන් තිදෙනෙකු ද ඇතුළුව පාලකයන් ඌසක් පාලනය කළ අතර ද්‍රවිඩ අධිකාරීවරයෙකු පස්යොදුන් රට පාලනය ගෙන ගිය අයුරුත්, ඉතිහාසයේ එන හිමිනමක් ප්‍රාදේශීය පාලකයෙකු ලෙස කටයුතු කළ එකම අවස්ථාවක් ද මෙම ප්‍රදේශය මුල් කරගනිමින් හෙළි වීම කැපී පෙනේ. මෙසේ පාලකයන් ඌසක් යටතේ සුඛිත, දුක්ඛිත කාල වකවානු ඔස්සේ ප්‍රාදේශීය වශයෙන් වැදගත් ඉතිහාසයක් පස්යොදුන් රට මුල්කොට ගොඩනැගී ඇති බව අවසාන ලෙස නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පද :** පස්යොදුන් රට, පාලකයන්, පොළොන්නරු යුගය, පෘතුග්‍රීසි අවධිය

[1,2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
hasithrandika1998@gmail.com